සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

44 S I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **නැටුම් (දේශීය) I** කාලය පැය දෙකයි

**අංක 01 - 40 දක්වා සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචන තෝරන්න.

1. උපහාස මුසු වූ ජනකතා ප්‍රවෘත්තියක් මුල්කොට ගායනය හා නර්තනය කරනුයේ,
   I. හනුමා වන්නම  II. කිරලා වන්නම
   III. නෛයඩි වන්නම  IV. සිංහරාජ වන්නම

2. උඩරට වන්නමකට අයත් කොටස් ..........කි.
   I. 4  II. 5
   III. 6  IV. 3

3. බඹර සරඹය, පැනීම් සරඹය, චන්ද්‍රිකා සරඹය....................ගොඩ සරඹ වේ.
   I. 9, 10, 11  II. 8, 9, 10
   III. 10, 11, 12  IV. 7, 8, 9

4. ගැටබෙරයේ සම්මත දිග ප්‍රමාණය හා බෙර ඇසෙහි සම්මත දිග ප්‍රමාණය.............කි.
   I. සිව් වියත් දෑගුල හා වියත  II. තුන්වියත් තුනගුල හා විග්ගුස්ස
   III. එක් වියත් තුනගුල හා විග්ගුස්ස  IV. එක් වියත් දෑගුල හා මිටිරියනකි

5. පත්තිනි දෙවියන් ප්‍රධාන දෙවියන්ට පුද පූජා පවත්වා නියමිත නැකත් වේලාවට ආරම්භ කරන ජන ක්‍රීඩාව ...............වේ.
   I. ඔංචිලි පැදීම  II. ලේන්සු හැංගීම
   III. කඹ ඇදීම  IV. එළුවන් කෑම

6. රාජ සභා වල පවන් සැලීම අනුගමනය කරමින් ...........නම් නර්තනය නිර්මාණය වී ඇත.
   I. සවරන්  II. පන්තේරු
   III. උඩැක්කි  IV. චාමර

7. බෙර වාදනයේදී බීජාක්ෂර වලට අමතරව බෙරයෙන් උපදවන උපකාරක්ෂර .......... යනුවෙන් හැඳින්වේ.
   I. ගර්භාක්ෂර  II. ගාත්‍රාක්ෂර
   III. මූලික අක්ෂර  IV. මාත්‍රාක්ෂර

8. ගම්පල යුගයේදී ලංකාවට පැමිණි දේශ සංචාරක වාර්තාකරු .............................ය.
   I. පාහියන් භික්ෂුව  II. රොබට් නොක්ස්
   III. ඉබන් බතුතා  IV. ස්පිල් බර්ජන්

9. සොබමන් දෙවිවරු සදෙනෙක් එතනට යන කවිය ...........සඳහා යොදාගත හැකිය.
   I. උඩැක්කි නැටුම  II. රබන් නැටුම
   III. පන්තේරු නැටුම  IV. චාමර නැටුම

10. නැටුම්, ගැයුම්, වැයුම් පැවැත්වීම සඳහා පොළොන්නරු යුගයේදී
   I. සරස්වතී මණ්ඩපය  II. කවිකාර මඩුව
   III. නර්තන අංගනය  IV. නිශ්ශංක ලතා මණ්ඩපය

ප්‍රශ්න අංක 11 සිට 40 දක්වා නිවරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. අවුරුදු සමයේදී වාදනය කරනුයේ,

I. විරිදු රබාන　　II. අත් රබාන
III. බංකු රබාන　　IV. තැටි රබාන

12. දුටුගැමුණු රජු නළගනන් පිරිවරාගෙන කණ්ඩුල ඇතුපිට නැගී රුවන්වැලි සෑයේ ධාතු නිදන් කිරීමේ උත්සවයට ගිය බව සඳහන් වන්නේ,

I. ථූප වංශයේය　　II. මහා වංශයේය
III. සිදත් සඟරාවේය　　IV. දීප වංශයේය

13. තකට තකට තක තරිකිට කුන්දත් තා තක ජිජි කුද යන කස්තිරම අදාල වන ගොඩ සරඹය වන්නේ,

I. පැනීම් සරඹය　　II. බඹර සරඹය
III. අංගහාර සරඹය　　IV. අර්ධ චක්‍ර සරඹය

14. දෙතිතේ ප්‍රභේද ගණනින්

I. දෙකකි　　II. හතරකි
III. එකකි　　IV. තුනකි

15. "මහනුවර පෙරහැරේ රූමත් තරුණයෝ ලස්සනට නටත්, ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේය" යනුවෙන් ලියා ඇත්තේ

I. රොබට් නොක්ස් වාර්තාවේය　　II. ඉබන්බතුතාගේ වාර්තාවේය
III. ස්පිල් බර්ජන් වාර්තාවේය　　IV. පාහියන් වාර්තාවේය

16. අතීතයේදී නර්තනය හදාරණ ආධුනිකයෙකු මූලික සරඹ අභ්‍යාසයේදී ආධාරකයක් ලෙස භාවිතා කොට ඇත.

I. දණ්ඩියම　　II. මණ්ඩිය　　III. මිටිරියන　　IV. නමස්කාරය

17. ගායනයත් වාදනයත් එකවර ආරම්භ කරනු ලබන්නේ,

I. අව ග්‍රහයෙනි　　II. සම ග්‍රහයෙනි
III. විශ්‍රම ග්‍රහයෙනි　　IV. නවග්‍රහයෙනි

18. ගැටබෙර වාදනයේදී පමණක් යොදා ගන්නා බෙර පදයකි.


I. දොදොංත තකුදොං　　II. රුදකිට තත්දොම්
III. ජෙං ජෙං තරිකිට　　IV. ජිමිත කුදා දොං

19. දොං දොං ජිං ජිං ගජිගත යන බෙර පදය අයත් වනුයේ

I. මාත්‍රා 2 + 3 ටය　　II. මාත්‍රා 2 + 4 ටය
III. මාත්‍රා 4 + 3 ටය　　IV. මාත්‍රා 4 + 4 ටය

20. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ගායනය සහිත නර්තන අංගයකි.

I. ආවැද්දුම　　II. දුනුමාලප්පුව
III. යක්ඇනුම　　IV. අස්නය



21. ඉහත රූප සටහන දේශීය ශාන්ති කර්මයකට අයත්ය. එම ශාන්ති කර්මය නම්,

I. දෙවොල්මඩුව　　II. පහන් මඩුව
III. කොහොඹා කංකාරිය　　IV. රට යකුම

22. මෙම රූප සටහනෙන් දැක්වෙන්නේ,

I. අයිලය　　II. යක්ගෙය
III. තොරණ　　IV. වීදිය

23. හයි තට්ටුව අයත් වාද්‍ය භාණ්ඩය වන්නේ,

I. ගැටබෙරයටය　　II. දවුලටය
III. උඩුක්කියටය　　IV. දෙවොල් බෙරයටය

24. දේශීය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයේදී විතත හා සුෂිර ගණයට අයත් වාද්‍ය භාණ්ඩ වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | පංතේරුව හා බටනලාව | II. | ගැටබෙරය හා තම්මැට්ටම |
| III. | තම්මැට්ටම හා හොරණෑව | IV. | දවුල හා හග්ගෙඩිය |

25. නර්තනයේදී රංග වස්ත්‍රාභරණ හා සැරසිලි අයත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | සාත්වික අභිනයටය | II. | වාචික අභිනයටය |
| III. | ආංගික අභිනයටය | IV. | ආහාර්‍ය අභිනයටය |

26. පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන් වලදී නර්තනයක් අවසන් කරන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | කලාසම හා ඉරට්ටිය | II. | ඉරට්ටිය හා කලාසම |
| III. | ඉරට්ටිය හා අඩව්ව | IV. | ඉරට්ටිය හා කස්තිරම |

27. දේශීය ශාන්තිකර්ම වලදී දෙවියන්ට පොරොන්දු වීම අරමුණු කොට සිදු කරන පූර්ව චාරිත්‍රයකි.

| | | | |
|---|---|---|---|
| ෂග | කප් සිටුවීම | II. | තොටමෙට යාම |
| III. | මඩුව සැදීම | IV. | ආරාධනය |

28. ගසමින් .......................දෙපළුව අසුර....................................
......................................පළු දෙක ගෙන.................................

I. සැණකෙන් - දැරුපා - අසුරසෙන් - සෙන්
II. කඟ පතින් - සෙන් - දැරුපා අතළුවෙන් - සැනෙකින්
III. සහගොස් - යුදෙන් - අසුරන් කල යුදෙන් - සැණෙකින්
IV. අසුරන් කල යුදෙන් - දැරුපා අතළුවෙන් - සැණෙකින්

29. තාල තැබීමේදී භාවිතා කරන අඩුම මාත්‍රා ගණන හා වැඩිම මාත්‍රා ගණන,

| | | | |
|---|---|---|---|
| I. | මාත්‍රා 3 හා 4 කි | II. | මාත්‍රා 2 හා 3 කි |
| ෂෂග | මාත්‍රා 2 හා 4 කි | IV. | මාත්‍රා 1 හා 2 කි |

30. මාත්‍රා 4 + 4 තාල රූපයට නර්තනය කරනු ලබන වන්නමකි.

| | | | |
|---|---|---|---|
| I. | සිංහරාජ වන්නම | II. | සැවුලා වන්නම |
| III. | හනුමා වන්නම | IV. | නෛයඩි වන්නම |

31. ප්‍රස්තාරකරණයේදී නොඇදෙන අක්ෂර හඳුන්වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | ගුරු මාත්‍රා නමිනි | II. | ලඝු මාත්‍රා නමිනි |
| III. | හලන්ත ගුරු නමිනි | IV. | ප්ලුත මාත්‍රා නමිනි |

32. තත්ත තරි තරි - තතරි තරි තරි ........ යන අඩව්ව අයත් වන්නම වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | තුරඟා වන්නමටය | II. | සිංහරාජ වන්නමටය |
| III. | සැවුලා වන්නමටය | IV. | නෛයඩි වන්නමටය |

33. මාත්‍රා 3 4 දෙතිත තාල රූපයට අයත් බෙර පදයකි.

| | | | |
|---|---|---|---|
| I. | දොං ජිංත ගත දොංත | II. | දෝං ජිංජිං තකට දොංතක |
| III. | දොං දොං ජිං ජිං ගජිගත | IV. | ජිං ගත ගොගො |

ප්‍රශ්න අංක 34 - 36 සඳහා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරින් තෝරන්න.

| A | B | C |
|---|---|---|
| විජය රජු | ඉලංගම් සරඹ | කෝලාට්ටම් |
| දොඹින පද | කාවඩි | කුළු |
| දුටුගැමුණු රජු | පඬුවස් දෙව් රජු | මාත්‍රා පද |
| ලී කෙලි | ගොඩ සරඹ | සේරමාන් රජු |

34. සබරගමු නර්තන සම්ප්‍රදායේ මූලික සරඹ අභ්‍යාස ඇතුලත් වර්ණය වනුයේ,

I. B පේලියේ 4 තීරුවේ හා C පේලියේ 3 තීරුවේය
II. A පේලියේ 2 තීරුවේ හා B පේලියේ 4 තීරුවේය
III. B පේලියේ 1 තීරුවේ හා C පේලියේ 3 තීරුවේය
IV. A පේලියේ 2 තීරුවේ හා C පේලියේ 3 තීරුවේය

35. ද්‍රවිඩ ගැමි නැටුම් අයත් වනුයේ,
- I. A පේලියේ 4 තීරුවේ හා C පේලියේ 1 තීරුවේය
- II. B පේලියේ 2 තීරුවේ හා C පේලියේ 1 තීරුවේය
- III. C පේලියේ 1 තීරුවේ හා B පේලියේ 2 තීරුවේය
- IV. A පේලියේ 3 තීරුවේ හා B පේලියේ 2 තීරුවේය

36. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ප්‍රථමයෙන්ම දිවිදෝෂය සැදුනු රජු ඇතුලත් වරණය වනුයේ,
- I. A පේලියේ 3 තීරුවේය  II. B පේලියේ 3 තීරුවේය
- III. A පේලියේ 1 තීරුවේය  IV. C පේලියේ 4 තීරුවේය

37. දොං ජිංත ගත දොංත යන බෙර පදයට වාදනය කළ හැකි අලංකාර බෙර පදයකි.
- I. දොං තකු දොං ජිං තත් ජිං තත් ජිං තරිකිට
- II. කුං ජිං ගත්තත් ජිංතක තරිකිට
- III. ජිං තරිකිට ජිං කුකුතක
- IV. දොංතක දොංතක තරිකිට ජිංතක ජිංතක තරිකිට

38. පහතරට සිංදු වන්නම් ගණනින්,
- I. 18 කි  II. 24 කි  III. 32 කි  IV. 12 කි

ප්‍රශ්න අංක 39-40 ප්‍රශ්න වලට පහත රූප සටහන ඇසුරු කර ගනිමින් පිළිතුරු සපයන්න.



A B C

39. ඉහත A, B හා C රූප සටහන් වල නාමයන් වනුයේ,
- I. උරබාහු, ඉන හැඩය, සිලම්බු  II. උරබාහු, කරපටිය, සිලම්බු
- III. බන්දි වළලු, ඉන හැඩය, සිලම්බු  IV. උරබාහු, කර පටිය, බන්දි වළලු

40. වෙස් ඇඳුම් කට්ටලයේ කෛමෙත්ත පළඳිනු ලබන්නේ,
- I. හිසටය  II. පපුවටය  III. උරටය  IV. මැණික් කටුවටය

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

44 S II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **නැටුම් (දේශීය) II** කාලය පැය දෙකයි

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

1. I. මහනුවර යුගයේ ...........................................................වන්නම් 18 රචනා කරන ලදී.
   II. සැවුලා වන්නම මාත්‍රා ...................................................තාල රූපයට නර්තනය කළ හැකිය.
   III. 9 වෙනි ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ .............................................සරඹයයි.
   IV. දෙවොල් බෙරයට කියන තවත් නමකි .........................................බෙරය.
   V. ගාල්ල, මාතර ප්‍රදේශවල ...................... නැටුම ප්‍රචලිතය.
   VI. ත්‍රිවිධ ඥාණ විදුරු යන කවිය ................................වලට අයත් වේ.
   VII. නර්තනයක එන ගායනය ....................................................අභිනයට අයත් වේ.
   VIII.
   IX. එකම පුරාවෘත්තය සඳහන් ශාන්තිකර්ම දෙක නම් කරන්න.

   1. .......................................... 2. ..........................................................

   X. කොහොඹා කංකාරියේ නාට්‍යමය ලක්ෂණ සහිත පෙළපාලි අංග 2 ක් ලියන්න.

   1......................................................... 2. ..........................................................

(ල.12)

2. I. මාත්‍රා 4 තනිතිතට අදාල බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.
   (ල.04)
   II. මාත්‍රා 2+3 තාලයට අයත් වන්නමක අඩව්වක් ප්‍රස්ථාර කරන්න.
   (ල.04)
   III. සිංහරාජ වන්නමේ කවියක් ලියන්න.
   (ල.04)

3. දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම අතුරින් එක් ශාන්ති කර්මයක් පිළිබඳ පහත සඳහන් සිරස්තල යටතේ විස්තර කරන්න.

   I. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ චාරිත්‍ර විධි 02 ක් හා වාදන අවස්ථා 2 ක් නම් කරන්න.
   (ල.04)
   II. කොහොඹා කංකාරි ශාන්තිකර්ම පැවැත්වීමේ හේතු 2 ක් අතීත හා වර්තමාන වශයෙන් වෙන්කර කරන්න.
   (ල.04)
   III. ශාන්තිකර්ම සැරසිලි සඳහා පරිසරයෙන් සොයා ගන්නා ද්‍රව්‍ය 04 ක් නම්කර සැරසිලි පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
   (ල.04)

4. පහත සඳහන් මාතෘකා 3 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   I. කස්තිරම
   II. මණ්ඩිය
   III. ගැමි නැටුම්
   IV. ගැටබෙරය
   V. වන්නම්

(ල.04)

(ල.4x3=12)

5. I. නර්තන කලාව පිළිබඳ තොරතුරු අනාවරනය කල හැකි මූලාශ්‍ර 2 ක් නම් කරන්න.
(ල.04)

II. නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුන බවට මහා වංශය ඇසුරින් සාධක දෙකක් සඳහන් කරන්න.
(ල.04)

III. නර්තන කලාවට භාරතීය ආභාෂය ලැබුන බවට දේශාටන වාර්තා ඇසුරින් සාධක දෙකක් පිළිබඳ අදහස් දක්වන්න.

6. රූපවාහිනී නාලිකාවන් පිළිබඳ විමසීමේදී නර්තන නිර්මාණ කරුවන් දේශීයත්වයට වඩා විදේශීය අනුකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇත.

I. නර්තන නිර්මාණවල තිබෙන අංගහාරවල ස්වභාවය
(ල.04)

II. ඇඳුම් පැළඳුම්වල විදේශීය ආභාෂය
(ල.04)

III. සංගීතය හා වාදනය (ල.04)

ඉහත මාතෘකා අනුව කරුණු පැහැදිලි කරන්න.

7. නර්තනය හැදෑරීම තුළින් දරුවෙකු වර්ධනය කර ගන්නා ගුණාංග පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
(ල.12)

**පළමු වාර පරීක්ෂණය - 2018**
**නර්තනය - 10- ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | IV | 11. | III | 21. | III | 31. | II |
| 2. | III | 12. | II | 22. | I | 32. | IV |
| 3. | III | 13. | II | 23. | IV | 33. | II |
| 4. | II | 14. | III | 24. | III | 34. | IV |
| 5. | I | 15. | IV | 25. | IV | 35. | II |
| 6. | IV | 16. | I | 26. | II | 36. | III |
| 7. | I | 17. | II | 27. | I | 37. | I |
| 8. | III | 18. | I | 28. | II | 38. | III |
| 9. | IV | 19. | II | 29. | III | 39. | II |
| 10. | I | 20. | IV | 30. | I | 40. | IV |

II කොටස

1. I. උඩරට
   II. 2+4 තාල රූපයට
   III. දෑත පෑගීමේ සරඹය
   IV. පහතරට බෙරය, රුහුණු බෙරය, යක් බෙරය, දිග් බෙරය, සොෂක බෙරය
   V. පහතරට නැටුම
   VI. රබන්
   VII. වාචික
   VIII. අස්නය
   IX. I. දෙවොල් මඩුව II. පහන් මඩුව
   X. I. ගුරුගේ මාලාව II. යක්කම්

2. මාත්‍රා 4 තනි තිතට බෙර පදය

| / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|
| දො දොං - ත | ත කු දොං - | දො දොං - ත | ත කු දොං - |

II.

| ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | - | ත | ක | ට | ත | ක | රොම් | - | - |
| තක් | කඩ | තක් | කඩ | කුද | ත | ක | රොම් | - | - |
| ත | ක | රොම් | - | ග | ජිං | - | ජි | කු | ද |
| කි | ටි | ත | ක | ට | කුන් | - | දත් | - | - |
| ත | ක | රොම් | | | | | | | |

III. ඕනෑම කවියක් ලියා ඇත්නම් (ල.04)

3. I. කප් සිටුවීම, මඩුව සෑදීම, තොට පේ කිරීම...ආදී ලෙස නම්කර ඇත්නම්
   II. අතීත, වර්තමාන වශයෙන් වෙන්කර හේතු 2 ක් වෙන්කර දක්වා ඇත්නම්
   III. ගොක්කොළ, ලී කෝටු, කෙසෙල් කොළ, පට්ටා, හබරල කොළ ආදී වශයෙන් වෙන්කර සැරසිලි පිළිබඳ විස්තර කර ඇත්නම්
   (අයිලය පිදේනි තටු, මඩුව සැරසීම මල්යහන ආදී වශයෙන්)

4. තෝරාගත් මාතෘකා වලට අදාලව පිළිතුරු ලියා ඇත්නම්
   (ල.04)

5. I. සෙල්ලිපි/ වංශකතා, රූකම්/ දේශාටන වාර්තා ආදී වශයෙන් 2 ක් සඳහන් කර ඇත්නම්

   II. නලගනන් 16000 ක් පිරිවරා රුවන්වැලි සෑය උත්සවයට ගිය වග
   මහා පරාක්‍රමබාහු රජු නැටුම් , ගැයුම්, වැයුම්, සදහා සරස්වතී මණ්ඩපයට ඉදිකල බව එහි දක්ෂ නළු නිළියන් යෙදවූ බව ආදී වශයෙන් සදහන් කර ඇත්නම්

   III. රොබට් නොක්ස් /ස්පිල් බර්ජන්/ ඉබන් බතුතා ගේ වාර්තාවල විස්තර සඳහන් කර ඇත්නම්
   (ල.06)

6. මාතෘකා අනුව කොටස් පැහැදිලි කර ඇත්නම් එකකට ලකුණු 4 බැගින්

7. නර්තනයේදි නමස්කාරය කිරීම/ තෙරුවන් නැමදීම/ ගුරුවරයාට ආචාර කිරීම/ වැඩිහිටියන්ට ආචාර කිරීම/ සමගිය/ සහයෝගයෙන් කටයුතු කිරීම/ නායකත්වයට ගරු කිරීම/ කණ්ඩායම් හැගීම